**<u>සහකාර කොමසාරිස් (තාක්ෂණ) තනතුර සඳහා සඳරේඛා ලියනගේ මහත්මිය වැඩ භාරගන්නා ලදී.</u>**

දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පැවති සහකාර කොමසාරිස් (තාක්ෂණ) තනතුරට බඳවා ගැනීම සඳහා 2017.10.28 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණයෙන් හා 2018.07.19 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් ඉහලම ලකුණු ලබමින් තේරී පත්වූ සඳරේඛා ලියනගේ මහත්මිය අද දින (2018/10/18) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, අශෝකා අලවත්ත මහත්මිය අතින් පත්වීම් ලිපිය භාරගන්නා ලදී.

අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) සුසීමා විජේසේකර මහත්මිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් පී.චන්දිමා සිගේරා මහත්මිය, සහකාර කොමසාරිස් හර්ෂිකා එදිරිවීර මහත්මිය සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙක් මෙම අවස්ථාවට සහභාගී විය.

1999 වර්ෂයේදී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරක් වන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී තනතුරට ඇතුලත් වූ සඳරේඛා ලියනගේ මහත්මිය මෙතෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයකට අනුයුක්තව ක්ෂේත්‍ර රාජකාරීවල නියැලී ඇති ළමාරක්ෂාව හා ළමා අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ අත්දැකීම් බහුල නිලධාරිනියකි. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් අතුරින් මෙම තනතුරට පත් වූ පළමුවැන්නා මැය වීම විශේෂත්වයකි.